ශීර්ෂය 149 - කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 149 - කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 ජූනි 11 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 14 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-6 ආකෘතිය තුළ රු.1,645,805 ක් දක්වා තිබූ නමුත් මූල්‍ය නොවන වත්කම්වලට අදාල භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් හා අමාත්‍යාංශයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වලට අදාල 2102, 2103 වැය විෂයයන් තුළ දක්වා තිබූ වටිනාකම රු.13,123,501 ක් වී තිබූ හෙයින් රු.11,477,696 ක වෙනසක් පැවතුණි.	වෙනසට හේතුව මාර්ගගත පද්ධතියට දත්ත ඇතුළත් කිරීමේදී ඇති වූ දෝෂයක් ලෙස හඳුනාගෙන ඇති අතර ඉදිරියේදී එය සිගාස් පරිගණක වැඩසටහන මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	මූලධන වත්කම් අත්පත් කරගැනීම් ගිණුම්ගත කිරීම නිවැරදි කළ යුතුය.
(ii)	අමාත්‍යාංශය විසින් වියදම් දරා ඉදිකරන ලද ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කල යුතු වුවත් 1996 වර්ෂයේ සිට කර්මාන්තපුර 16 ක ඉදිකල පරිපාලන ගොඩනැගිලි 13 ක, කර්මාන්තශාලා 03 ක හා කාර්යාල නිවාස/සේවා ගොඩනැගිලි 02 ක වටිනාකම වූ රු.මිලියන 544.94 ක් 2024 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කර නොතිබුණි.	ගිණුම්ගත කර නොතිබූ රු.මිලියන 544.94ක වටිනාකම 2025 වර්ෂයට අදාළව ගිණුම්ගත කර ඇත.	අමාත්‍යාංශය මඟින් වියදම් දරා වත්කම් අත්පත් කර ගැනීම් නොපමාව ගිණුම්ගත කළ යුතුය.

(iii)	මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු ACA 6 අකෘතියේ 2024 දෙසැම්බර් 31 දිනට මගී වාහන වටිනාකම ලෙස දක්වා තිබූ රු.737,323,781 සඳහා විස්තරාත්මක උපලේඛනයක් ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයේ අවසාන ශේෂයට අදාලව කේවල ලැයිස්තුවක් ඉදිරිපත් කල හැකි අතර එය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා සාකච්ඡා කොට ඉදිරියේදී අවශ්‍ය ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	වත්කම්වලට අදාලව විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතුය.
(iv)	මෝටර් රථ වාහන පිළිබඳව සිගාස් තොරතුරු පද්ධතියෙහි ඇතුළත් එකතු වටිනාකම රු.60,300,000 ක් වූ රථවාහන පහක් අමාත්‍යාංශයේ රථවාහන අංශයෙන් ලබාදුන් තොරතුරුවල නොපැවතුණි.	අදාල වටිනාකම සිගාස් තොරතුරු පද්ධතියෙන් ඉවත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු දැනටමත් සිදු කෙරෙමින් පවතී.	සිගාස් තොරතුරු පද්ධතියෙහි වූ තොරතුරු හා රථවාහන අංශයේ තොරතුරු යාවත්කාලීන කර පවත්වා ගත යුතුය.
(v)	සිගාස් වැඩසටහනේ හා භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් අනුව අමාත්‍යාංශය සතුව එකතු වටිනාකම රු.5,513,319ක් වූ යතුරු පැදි 35 ක් පැවතුණද අමාත්‍යාංශයේ රථවාහන අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව යතුරු පැදි 2ක් පමණක් අමාත්‍යාංශය විසින් භාවිතා කරමින් පැවතුණි.	එම යතුරුපැදි 35ට අදාල හිමිකාරීත්වය විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විද්‍යා අංශය වෙත පැවරී ඇත.එම පවරා දීමට අදාල කටයුතු ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.	සිගාස් තොරතුරු පද්ධතියෙහි වන තොරතුරු යාවත්කාලීන කර පවත්වා ගත යුතුය.
(vi)	අමාත්‍යාංශයට අයත් වාහන 26ක් සිගාස් වැඩසටහනේ වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	අමාත්‍යාංශය වෙත මෑතකාලීනව අනයුක්ත කරන ලද රථවාහන වල පවරාගැනීමේ කටයුතු අවසන්වීමෙන් පසු වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	අමාත්‍යාංශයට අයත් වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වැය විෂයයන් 32ක්, මූලධන වැය විෂයයන් 06ක් හා උප ව්‍යාපෘති 04කට අදාල වැය විෂයයන් 39ක් සඳහා රු.2,875,181,044 ක අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් වර්ෂය තුල රු.1,605,189,978 ක් උපයෝජනය කළ පසු රු.1,269,995,066 ක ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට 99 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.	2024 වසරේ මුල් මාස 10ක කාලයක් කර්මාන්ත අමාත්‍යතුමා වැවිලි කර්මාන්ත හා සෞඛ්‍ය අමාත්‍යාංශවලද අමාත්‍යවරයා ලෙස කටයුතු කිරීම හේතුවෙන් වියදම අමාත්‍යාංශ අතර බෙදී යාම මත වියදම් දැරීම සීමා වීමත් රාජ්‍ය අමාත්‍යවරුන්ගේ ධූරකාලය 2024 සැප්තැම්බර් මස සිට අවසන් වීමත් 2024 අයවැය චක්‍රලේඛ අංක 1/2024 මත වියදම් පාලනය කිරීමත් පුරප්පාඩු සඳහා රජයේ බඳවා ගැනීම් සීමා කිරීමත්, 2024 වසරේ සාමාන්‍ය මිල මට්ටමේ පහළ යාමක් සිදුවීමත් විශ්‍රාමික ප්‍රතිලාභ ඉල්ලීම් සීමා වීමත් බැංකු විසින් දේපළ ණය ලබා දීම සීමා කිරීමත් හේතුවෙන් වැය විෂයන්වල ඉතිරිවීම් සිදු විය.	ප්‍රතිපාදන ඉතිරිවීම වලක්වා සැලසුම් කළ පරිදි වෙන්කළ ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට වග බලා ගත යුතුය.
(ආ)	පුනරාවර්තන වැය විෂයයන් 06ක හා මූලධන වැය විෂයයන් 05කට අදාලව වෙන් කර තිබූ ප්‍රතිපාදනයෙන් වර්ෂය තුලදී කිසිදු වියදමක් එම වැය විෂයයන් වලින් නොදැරීම මත රු.202,800,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.		
(ඇ)	කිසියම් වැය විෂයයක් සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන, ප්‍රමාණවත් නොවේ යැයි අපේක්ෂා කරනු ලබන අවස්ථාවකදී ඒ සඳහා මු.රෙ.66 මඟින් හෝ පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් ප්‍රතිපාදන ලබා ගැනීමට අපේක්ෂා කිරීමේදී එම වැය විෂයය මඟින් ඉදිරියේදී දැරීමට සිදුවන ගෙවීම් පිළිබඳ හැකිතාක් නිවැරදිව ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතු වුවත් රු.9,000,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබූ වැය විෂයයකට මු.රෙ.66 මඟින් රු.2,000,000 ක් ද පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.3,885,000 ක් ද අමතර ප්‍රතිපාදන ලබාගෙන තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එහි ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.14,885,000කින් රු.10,755,490 ක් පමණක් වියදම් කර රු.4,129,510 ක් ඉතිරි වී තිබුණි.	විශ්‍රාමික ප්‍රතිලාභ ඉල්ලීම සීමා වීම මත ඉතිරිවීම් සිදු විය.	ප්‍රතිපාදන වෙනත් වැය විෂයකින් ලබාගන්නා විට අවශ්‍යතාවයට පමණක් ප්‍රතිපාදන වෙන් කරවා ගත යුතුය.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරික්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ බැරකම් ලේඛනය හා මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයට (සටහන iii) ඇතුලත් කර නොතිබූ සමාලෝචිත වර්ෂයට අදාල බැරකම් රු.4,115,868 ක් අවස්ථා 49 ක් තුළ 2025 වර්ෂයේදී ගෙවා තිබුණි.	සිගාස් පද්ධතියට බැරකම් ගිණුම්ගත කළ හැකි අවසාන දිනය වූයේ 2025 ජනවාරි 31 දින ය. ගිණුම්ගත නොකළ බැරකම්වලට අදාල අංක 125 සිට 339 දක්වා වූ වවුචර්පත් අදාළ දිනයෙන් පසුව ඉදිරිපත් වූ ඒවා බැවින් සිගාස් පද්ධතියේ ඇතුළත් කොට නොමැත. මෙය ඉදිරියේදී නිවැරදි කර ගැනීමට බලාපොරොත්තු වේ.	මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් බැදීම් හා බැරකම් ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය.
(ආ)	2019 වර්ෂයේ අවස්ථා 43කට හා 2018 වර්ෂයේ එක් අවස්ථාවකට අදාල රු.727,693 ක බැරකම් 43 ක් පැවතියද එම බැරකම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	සිගාස් පරිගණක පද්ධතියේ මුද්‍රිත බැරකම් හා බැදීම් ලේඛනයෙහි 2018,2019 වර්ෂයන්ට අදාලව නොපිය වූ බැරකම් ඇති ලෙස දැක්වූවද සත්‍ය වශයෙන්ම අමාත්‍යාංශය සතුව නොපියවූ බැරකම් ලෙස 2018,2019 වර්ෂයට අදාලව වවුචර්පත් නොමැත. මේ පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කළ අතර එය සිගාස් පරිගණක පද්ධතියෙන් ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.	2018, 2019 වර්ෂ වලට අදාල බැරකම් නොමැති නම් ඒවා ඉවත් කරවා ගැනීමට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පෙර භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර ඉදිරි පියවර ගත යුතුය.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නිරීක්ෂණය		ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම		
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තිය	අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 08ක 2015 – 2024 කාල සීමාවට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරමින් පවතී.	වාර්ෂික වාර්තා නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.

(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

(i) මුදල් රෙගුලාසි 104(03)	වැල්ලවාය කර්මාන්තපුරයේ ඉදිකල වැට හා ගේට්ටුවට සිදුවී තිබූ අලාභ හානිය තක්සේරු කිරීමට අදාලව ප්‍රාරම්භක පරීක්ෂණය පැවැත්වීමට 2024 නොවැම්බර් 20 දින පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණද ප්‍රාරම්භක වාර්තාව විගණන දිනය වන 2025 මැයි 14 තෙක් ඉදිරිපත් කර නොතිබුණි.	ප්‍රාරම්භක පරීක්ෂණය 2025 මැයි 29 වන දින සිදු කර මු.රෙ 104 (3) යටතේ අලාභයන් පිළිබඳ වාර්තාව සකස් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත වේ.	සිදුවීමකට අදාල ප්‍රාරම්භක පරීක්ෂණ වහාම සිදුකර වාර්තාව ඉදිරිපත් කළ යුතුය.
(ii) මුදල් රෙගුලාසි 104 (04)	අලාභයක් සිදුවී මාස 03ක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවද 2024 මාර්තු 21 දින රථයක් ගිනිගැනීම හා 2024 අප්‍රේල් 09 වන දින අමාත්‍යාංශයේ ප්‍රතිව්‍යුහගතකරණ අංශය ජලයෙන් යටවීම සම්බන්ධව සිදු වූ අලාභයන් සම්බන්ධයෙන් පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	අදාල වාහන වර්ගයේ සමහර අමතර කොටස් වෙළඳපලේ සොයා ගැනීමට ඇති අපහසුතාවය නිසා වාහනය සඳහා සිදුව ඇති අලාභය තක්සේරු කිරීමට නොහැකි වී ඇති බැවින් පූර්ණ වාර්තාවක් ලබා දීමට ප්‍රමාද වී ඇත. ප්‍රතිව්‍යුහගතකරණ අංශය ජලයෙන් යටවීම හේතුවෙන් සිදු වී ඇති අලාභය තක්සේරු කිරීමට කටයුතු කර ඇති අතර අදාළ අලුත්වැඩියා කටයුතු සිදුකර ඇත. මේ සම්බන්ධව මු.රෙ. අනුව කමිටුවක් පත්කර පූර්ණ වාර්තාව සැකසීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමට සැලසුම් කර ඇත.	අලාභ සිදුවී මාස 03ක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

	(iii) මුදල් රෙගුලාසි 756	සමාලෝචිත වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි.	භාණ්ඩ සමීක්ෂණය කර කමිටු 02 ක පමණක් අදාල වාර්තා ඉදිරිපත් කර ඇත. මෙ වන විට අදාල වාර්තා ගිණුම් අංශය වෙත ලැබෙමින් පවතින අතර සියළු අංශවලට අදාල වාර්තා ලද විගස භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ලබා දීමට කටයුතු කරනු ලැබේ.	භාණ්ඩ සමීක්ෂණය නියමිත කාල රාමුව තුල සිදුකර වාර්තා ලබාදීමට කටයුතු කල යුතුය.
	(iv) මුදල් රෙගුලාසි 772 හා 2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	2023 වර්ෂයේදී හඳුනාගත් අපහරණය කළ යුතු භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	2023 වර්ෂයේදී හඳුනාගත් අපහරණය කල යුතු භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කරමින් පවති.	අපහරණය කිරීමට තීරණය කරන ලද භාණ්ඩ විධිවිධාන ප්‍රකාරව අපහරණ කිරීමට නොපමාව කටයුතු කළ යුතුය.
(ඈ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන වාහන 03ක පමණක් ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර තිබුණු අතර රථවාහන 95 ක ඉන්ධන දහන පරීක්ෂාව සමාලෝචිත වර්ෂය තුල කර නොතිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 අනුව, අනෙකුත් රථවාහනවල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව සිදුකළ යුතුය.
(ඈ)	2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය	ගමන් වියදම් සඳහා රු.450,000ක් අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි.	අත්‍යාවශ්‍ය කර්මාන්ත සංවර්ධන කටයුතු සඳහා සේවයේ යොදවන ලද නිලධාරීන්ට ඉටු කරන ලද කාර්යයන් සඳහා වූ ගෙවීම් ඉදිරි වර්ෂයට ගෙන නොගොස් අදාල වර්ෂයේම සිදු කිරීමට ගමන් වියදම් සඳහා රු.450,000 ක් පමණක් මු.රෙ.66 යටතේ වෙන් කරගෙන ඇත.	වැය විෂයය අතර ප්‍රතිපාදන මාරු කිරීමේදී චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය.

(ඉ)	2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කලමනාකරණ චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා යවා නොතිබුණි.	පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මිලදී ගන්නා ලද වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත දන්වා යැවිය යුතුය.
(ඊ)	අංක CGIR/2019/3 හා 2019 ජූලි 09 දිනැති දේශීය ආදායම් කොමසාරිස්ගේ චක්‍රලේඛය	ගෙවන ලද එකතු කල අගය මත බදු (VAT) පිළිබඳ කාර්තු වශයෙන් දන්වා යැවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී ගෙවන ලද එකතු කල අගය මත බදු (VAT) පිළිබඳ කාර්තු වාර්තා දේශීය ආදායම් කොමසාරිස් වෙත යැවීමට කටයුතු කරනු ලැබේ.	එකතු කල අගය මත බදු පිළිබඳව දේශීය ආදායම් බදු කොමසාරිස් වෙත දන්වා යැවිය යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අක්කර 200 ක භූමි ප්‍රමාණයක් තුළ රයිගම කර්මාන්තපුරය පිහිටුවීමට අපේක්ෂා කර තිබුණද කර්මාන්තපුරය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් හා සිදු කළ යුතු සංවර්ධන කාර්යයන් සඳහන් කරමින් ව්‍යාපෘති සැලැස්මක් සකස් කර නොතිබුණි. කර්මාන්තපුරය සඳහා 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.මිලියන 905 ක වියදම් දරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කිසිදු ආයෝජකයෙකු කර්මාන්ත ආරම්භ කිරීමට ඉදිරිපත් නොවීම හේතුවෙන් කර්මාන්තපුරය ආරම්භකිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හැකියාවක් නොමැති වූ අතර දරා ඇති වියදම නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි.	අක්කර 200ක භූමි ප්‍රමාණයක රයිගම කර්මාන්තපුරය සංවර්ධනය කිරීමට මූලිකව සැළසුම් කලද ඒ සඳහා 2016 ඔක්තෝබර් 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පාරිසරික පනතට අනුව, පාරිසරික ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළ යුතුව තිබුණි. අදියර කිහිපයක් මත ඉටු කිරීමට තීරණය වීම නිසා අක්කර 25 කට අඩු වූ හෙයින් පාරිසරික පනත අනුව පාරිසරික ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වී ඇත. දේශපාලන අධිකාරියේ තීරණ මත කැබිනට් අනුමැතිය යටතේ කඩිනමින් ආරම්භ කළ ව්‍යාපෘතියක් වූ මෙම කර්මාන්තපුර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර පූර්ව ශක්‍යතා අධ්‍යයනය, ප්‍රාදේශීය අධ්‍යක්ෂ (බස්නාහිර පළාත) විසින් සිදුකර ඇත. තවද 2019 නොවැම්බර් මාසයේ සිදු වූ දේශපාලන පෙරලිය සමඟ මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු තාවකාලිකව	නිසි ශක්‍යතා අධ්‍යනයකින් පසු ව්‍යාපෘති ආරම්භ කළ යුතු අතර ආරම්භකල කර්මාන්තපුර ව්‍යාපෘතිය නිසි සැලසුම් මත ක්‍රියාකරමින් නිසි පරිදි ඇරඹීමට කටයුතු කළ යුතුය.

		නතර කළ අතර ඉන් පසුව රට තුළ ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය, දේශපාලන අස්ථාවරභාවය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු ප්‍රමාද විය. නැවත මෙම ව්‍යාපෘතිය කරගෙන යාම සඳහා අනුමැතිය ලැබුනේ 2023 ජූලි 27 දින කර්මාන්ත අමාත්‍යතුමන් කර්මාන්තපුරයේ කටයුතු නිල වශයෙන් ආරම්භ කිරීමෙන් පසුව වන අතර එම කටයුතු සැලසුම් සහිතව සිදු කරමින් පවති.	
(ආ)	අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 10 ක 2019-2024 කාලසීමාවට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	වාර්තා ඉදිරිපත් කරන ලෙස අදාල ආයතන දැනුවත් කර කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	සියළුම ආයතන නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රතිව්‍යුහගත කිරීමට නියමිත ආයතන 08 ක ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.	ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය විසින් සහ සී/ස ජාතික කඩදාසි සමාගම විසින් ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කර නොමැති බවත් කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනයේ මිනිරන් සංචිත සෙවීම සඳහා පත්කරන ලද කමිටුවේ රැස්වීමේ වාර්තා ලැබී නොමැති බවත් සී/ස ලංකා ලේලන්ඩ් සමාගම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලැබී නොමැති බවත් සී/ස ජාතික ලුණු සමාගම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයේ තීරණය අධිකරණය වෙත ඉදිරිපත් කිරිම සඳහා නිතිපති දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇති බවත් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ කන්කසන්තුරේ සිමෙන්ති කම්හල පිහිටි ඉඩම පවරා ගැනීමේ කටයුතු ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය විසින් සිදුකරනු ලබන බවත් සී/ස සිමෙන්ති සමාගම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් කැඳවා ඇවර කිරීමට නියමිත බවත් සීමා සහිත පරන්තන් කෙමිකල් සමාගමෙහි කොස්ටික් සෝඩා / ක්ලෝරීන් ව්‍යාපෘතිය සඳහා සකස් කරන ලද පිරිවැය වාර්තා දෙකෙහි පිරිවැය වෙනස්වීමට හේතු ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවෙන් විමසා ඇති බවත් දන්වා ඇත.	අදාල ආයතන 8 හි ප්‍රතිව්‍යුහගත කිරීම් අනුමත පරිදි සිදුකර ඒවායේ කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීමට නොපමාව කටයුතු කල යුතුය. ඇවර කිරීමට නියමිත ආයතන පවතී නම් එම කටයුතු කඩිනම් කිරීමට අවධානය යොමු කළ යුතුය.

(ඈ)	කරන්දෙනිය කර්මාන්තපුරයේ කුරුඳු සැකසුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම, අත්යන්ත්‍ර රෙදිපිලි කර්මාන්තය සඳහා අමුද්‍රව්‍ය කලමනාකරණ වැඩසටහන සඳහා ඇස්තමේන්තු සකස් කර තිබුණ ද එම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ සඳහා 2024 වර්ෂයේදී කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි කාර්මික තාක්ෂණික ආයතනය මඟින් ව්‍යාපෘති යෝජනාව හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ ද මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු වී නොමැති බව.	සැලසුම්ගත ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලස්වා ගැනීමට හා සැලසුම් ප්‍රකාරව නිමකිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	2023 වර්ෂයේදී රු.8,383,056 ක් වැයකර වැල්ලවාය කර්මාන්තපුරය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර තිබුණ ද 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ මෙම කර්මාන්තපුරය සංවර්ධන කටයුතු සඳහා ක්‍රියාකාරකම් ඇතුළත් කරමින් ප්‍රතිපාදන වෙන්කර නොතිබීම නිසා මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි.	ජාතික අයවැය තුළින් කර්මාන්තපුරයන්හි සංවර්ධන කටයුතු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ සීමිත ප්‍රමාණයකි. එම සීමිත ප්‍රතිපාදන, ඒ ඒ කර්මාන්තපුරයන්හි ආයෝජකයින්ගේ ඉල්ලුම යටතේ සිදුකල යුතුව ඇති සංවර්ධන කාර්යයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් වර්ෂය සඳහා සකසා ගන්නා ලද ක්‍රියාකාරි සැලැස්මට අනුව භාවිතා කෙරේ. එහිදී වැල්ලවාය කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු සඳහා 2024 වර්ෂයට ප්‍රතිපාදන වෙන් නොකෙරුණි.	කර්මාන්තපුරයන් හි කර්මාන්ත සඳහා ආයෝජකයින්ගේ ඉල්ලුම හඳුනාගෙන ඒ අනුව ප්‍රතිපාදන වෙන් කරවා ගත යුතුය.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කර්මාන්තපුර සංවර්ධනය යටතේ රජයේ ඉඩම් අක්කර 281.399 ක ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලද කර්මාන්තපුර 09 ක් සඳහා රජය විසින් රු.මිලියන 1542 ක පිරිවැයක් දරා ඇතත් ඒවායේ කිසිදු කර්මාන්තයක් ආරම්භ කර නොතිබුණි.	අළුතෑපොල, රයිගම, බුලත්සිංහල, කටුනායක, නොච්චියාගම, දඹුල්ල, සූරියවැව යන කර්මාන්තපුරයන්හි සිදු කිරීමට අවශ්‍ය සියළුම සංවර්ධන කටයුතු සිදු කෙරෙමින් පවතින අතර අළුතෑපොල, රයිගම හා සූරියවැව යන කර්මාන්තපුරයන්හි එම මූලික යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් බොහොමයක කටයුතු මේ වන විට අවසන් අදියරේ පවතී. කර්මාන්තපුරයන්හි මූලික යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් අවසන් වන තෙක් ආයෝජකයන් හට තම කර්මාන්ත ව්‍යාපෘති ආරම්භ කිරීමේ හැකියාවක් නොමැත. තිරයිමඩු (මඩකලපුව) කර්මාන්තපුරයේ සියළු යටිතල පහසුකම්	අපේක්ෂිත පරිදි කර්මාන්තපුර ඉදිකිරීම් කටයුතු නිම කිරීමට වග බලා ගත යුතුය.

		සංවර්ධන කටයුතු අවසන් කර ඇති අතර අක්කර 3.25ක ඉඩම් ප්‍රමාණයක් හැර සෙසු ඉඩම් කොටස් ආයෝජකයන් 8 දෙනෙකු වෙත වෙන් කර ඇත. අනෙකුත් කර්මාන්තපුරයන්හි ඉඩම් ලබා ගැනීම සඳහා ආයෝජකයින්ගේ ඉල්ලීම් ලැබෙමින් පවතී.	
(ආ)	දිස්ත්‍රික්ක 21 ක කර්මාන්තපුර ආරම්භ කිරීමේදී වෙන්කරන ලද මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 1,340 ක් වුවත් කර්මාන්ත සඳහා එයින් අක්කර 741.50 ක් පමණක් වෙන්කර තිබූ හෙයින් අක්කර 598.50 ක ඉඩම් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිෂ්කාර්යව පැවතුණි.	2019 වර්ෂයෙන් ඇරඹි පාස්කු ප්‍රහාරය, 2020 වර්ෂයේ ඇති වූ කොරෝනා වසංගත තත්වය, පසුව වසර 03ක පමණ කාලයක සිට රටෙහි ඇති වූ ආර්ථික අර්බුදය, රජය විසින් පනවන ලද විවිධ සීමා කිරීම්, ඇමෙරිකානු ඩොලරයේ අගය ඉහළ යාම, විදුලි කප්පාදුව හා විදුලි බිල ඉහළ නැංවීම, මෙරටින් අපනයනය කරනු ලබන නිෂ්පාදනයන් සඳහා වන විදේශීය වෙළඳ පොළ සංකෝචනය වැනි හේතූන් මත කර්මාන්තශාලාවල නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමට නොහැකිවීම, පුහුණු ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා යොමු වීම යන කරුණු මත තම නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමේදී සියළු පළාත්වල කර්මාන්තකරුවන්හට බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වී ඇත. මේ හේතුවෙන් අමාත්‍යාංශය අපේක්ෂා කළ මට්ටමින් කර්මාන්තවල කටයුතු සිදු නොවූ බව.	වෙන් කරන ලද ඉඩම් නිසි පරිදි කර්මාන්තපුරයන් සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2017 වර්ෂයේ කළුතර රයිගම කර්මාන්ත හා තාක්ෂණ සංවර්ධන අධිකලාපය තුල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව ලබාදුන් මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්) සමාගම (CESL), අදාල භූමියේ පවතින රබර් ගස් ඉවත් නොකිරීම, වැව්ලි සමාගම්හී විරෝධතා හා ජලමාර්ග පද්ධතිය සම්පූර්ණ නොකිරීම යන හේතූන් පාදක කරගෙන 2025 අප්‍රේල් වන විටත් ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත් කටයුත්ත සම්පූර්ණ කර නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය යටතේ සංවර්ධනයට බාධා වී ඇති කොස් ගස් කපා ඉවත් කිරීමෙන් පසු අභ්‍යන්තර මාර්ගයේ සංවර්ධන කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. කර්මාන්තපුරයේ ආරක්ෂිත වැට ඉදිකිරීමට බාධා වී ඇති රබර් ගස් ඉවත් කර ගැනීම සඳහා වැව්ලි සමාගම සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිලධාරීන් සමග 2025 පෙබරවාරි 17 දින සාකච්ජාවක් පවත්වන ලදී. වැව්ලි සමාගම විසින් මිල්ලනිය කර්මාන්තපුරයේ ඉඩම සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් ගොනුකර පවතින බැවින් ඉවත් කිරීමට අදාල රබර් ගස්වල වටිනාකම සඳහා තක්සේරු වාර්තාවක්	කටයුතු කඩිනමින් අවසන් කිරීමට පවතින බාධා පිළිබඳව දැඩි අවධානය යොමු කර කාර්යය අවසන් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සැලසුම්ගතව සිදුකළ යුතුය.

		ලබාගත යුතු බවත් එම ගස් වෙන්දේසි කර අදාල මුදල් අධිකරණයේ තැන්පත් කිරිමටත් තීරණය විය. තවද, ප්‍රවේශ මාර්ගය ඉදි කිරිමට පර්චස් 80ක ඉඩම් කොටසක් අත්පත් කර ගැනීමට අවශ්‍යව පවතින අතර එහි මැනුම් කටයුතු සිදු කිරීම, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පැවති වෘත්තීය ක්‍රියාමාර්ගයක් හේතුවෙන් ප්‍රමාද වීම නිසා, අදාල ඉඩම් කොටස අත්පත් කර ගැනීමේ කටයුතුද ප්‍රමාද වුණි. මෙම ප්‍රමාදවීම හේතුවෙන් ජල සැපයුම් පද්ධතිය සඳහා ප්‍රවේශ මාර්ගය දිගේ ජලනල එලිමේ සංවර්ධන කටයුතු ආරම්භ කිරිමට නොහැකි වී ඇත.	
(ඇ)	කර්මාන්තපුර ආරම්භ කිරීමේදී ව්‍යාපෘති යෝජනාවන්ට අනුව කර්මාන්තපුර 24 ක අපේක්ෂිත සේවක සංඛ්‍යාව 32,588 ක් වුවත් සත්‍ය වශයෙන් සේවයේ යෙදෙන සංඛ්‍යාව 15,949 ක් හෙවත් සියයට 51 ක අවම මට්ටමක පැවති හෙයින් අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීම අවම මට්ටමක පැවතුණි.	පසුගිය වසර කීපය පුරා රටෙහි පැවති කොරෝනා වසංගත තත්වය, රටෙහි ආර්ථික අර්බුදය, ඉන්ධන හිඟකම, අමුද්‍රව්‍ය මෙරටට ගෙන්වා ගැනීමට නොහැකි වීම, ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි පසුබෑම, නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ අලෙවිකර ගැනීමට නොහැකි වීම, විදුලි බිල ඉහළ යාම, ශ්‍රමිකයන් වෙනත් රටවලට සංක්‍රමණය විම වැනි කරුණු හේතුවෙන් බොහෝ කර්මාන්තයන්ට තම නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට මෙන්ම උපරිම ධාරිතාවයකින් යුතුව නිෂ්පාදන කටයුතු සිදුකරගෙන යාමට නොහැකිවී ඇත. එවැනි තත්වයක් තුල කර්මාන්ත පවත්වාගෙන යාම සඳහා පිරිවැය අවම කිරීමට හා බොහෝ ආයතනවලට චක්‍රීය ක්‍රමයට මෙන්ම අවම සේවක පිරිසක් උපයෝගි කරගනිමින් නිෂ්පාදන කටයුතු කිරීමට සිදුවී ඇත.	ඉලක්ක සපුරා ගැනීමට ප්‍රමාණවත් මානව සම්පතක් පවත්වා ගත යුතුය.

4.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කරන්දෙනිය කර්මාන්තපුරයෙහි ප්‍රවේශ මාර්ග අලුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 65.98 ක් වියදම් දරා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එහි භෞතික ප්‍රගතිය සියයට 0 ක් වී තිබුණි. කටුනායක කර්මාන්තපුරයක් ඇති කිරීම සඳහා රු.මිලියන 4.1ක් ඇස්තමේන්තු කර තිබුණද එහි භෞතික ප්‍රගතිය සියයට 2 ක් තරම් අඩු මට්ටමක පැවතුණු අතර කිසිදු මුදලක් වියදම් දරා නොතිබුණි.	මධ්‍ය කාලීන කාලරාමුවක් සහිත මෙම සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය වර්ෂය අවසානයේ මෙම ප්‍රතිපාදන නිදහස් කිරීම මත මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ඊට අදාළ ප්‍රසම්පාදන කටයුතු හා සංවර්ධන කටයුතු 2025 වර්ෂයේදී ආරම්භ කර සිදු කර ගෙන යමින් පවතින බව. කටුනායක කර්මාන්තපුරයට අදාලව මූලික පාරිසරික අධ්‍යයන වාර්තාව ලබා ගැනීමට අදාලව රු.150,000 ක මුදලක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ගෙවා එම වාර්තාව සැකසීමේ කාර්යය ප්‍රසම්පාදන අංශය මඟින් කාර්මික තාක්ෂණ ආයතනය තෝරා දෙන ලදී. මූලික පාරිසරික අධ්‍යයන වාර්තාව සැකසීමට කාර්මික තාක්ෂණ ආයතනය සමඟ ගිවිසුම්ගතව සියයට 40 ක අත්තිකාරම ගෙවා ඇතත් එම වාර්තාව මේ වන තෙක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත්කර නොමැත.	කටුනායක ව්‍යාපෘතියේ මූලික පාරිසරික අධ්‍යන වාර්තාව කඩිනමින් ලබාගැනීමට කටයුතු කළ යුතුය. කරන්දෙනිය ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් නිමකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා පරීක්ෂාවේදී ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 772 ක් වූ ව්‍යාපෘති 07 ක භෞතික ප්‍රගතිය 10% - 25% ත් අතර ද ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 185.59 ක් වූ ව්‍යාපෘති 21 ක භෞතික ප්‍රගතිය 25% - 50% ත් අතර ද ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 109.08 ක් වූ ව්‍යාපෘති 17 ක භෞතික ප්‍රගතිය 50% - 75% ත් අතර ද ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 342.15 ක් වූ ව්‍යාපෘති 35 ක භෞතික ප්‍රගතිය 75% - 99% ත් අතර පරාසයක පැවති අතර සමාලෝචිත වර්ෂය අවසාන වීමට පෙර මෙම	පිළිතුරු ලබාදී නොමැත.	ව්‍යාපෘති සැලසුම් කිරීමේදී පවතින ප්‍රායෝගික තත්ත්වයන් සැලකිල්ලට ගෙන කටයුතු කළ යුතු අතර සැලසුම් කළ පරිදි කටයුතු නිම කළ යුතුය.

ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරික්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂයේ අපහරණය කිරීම සඳහා හඳුනාගෙන තිබූ වාහන 08කින් එක් වාහනයක් පමණක් වෙන්දේසි කර තිබූ අතර වාහන 03ක් කර්මාන්ත සංවර්ධන මණ්ඩලයට පවරාදීමට කටයුතු කර තිබුණි. ඉතිරි වාහන 04 සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	2023 වර්ෂයේ වෙන්දේසි සඳහා යොමු කරන ලද වාහන 08 ක් 2024 වර්ෂයේ වෙන්දේසි කිරීමට කටයුතු කළ අතර එක් වාහනයක් පමණක් වෙන්දේසියෙන් විකිණී ඇති අතර එම අවස්ථාවේදී වෙන්දේසි නොවූ රථ වාහන 03 ක් අබලි ලෙස කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත පවරා දීමට කටයුතු කර ඇත. අනෙකුත් වාහන නැවත මෙම වර්ෂයේ වෙන්දේසිය සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී.	අපහරණය කළ යුතු වාහන විධිවිධාන ප්‍රකාරව කඩිනමින් අපහරණය කළ යුතුය.
(ආ)	අපහරණය කිරීමට අනුමැතිය ලබාදී තිබූ රථ වාහන හැරුණුකොට වාහන 06 ක් අලුත්වැඩියා කිරීමකින් තොරව අමාත්‍යාංශ පරිශ්‍රයේ හා අලුත්වැඩියා සඳහා යොමු කරන ලද ආයතනවල ගාල් කර තිබුණි.	අපහරණය කිරීමට අනුමැතිය ලබා දී තිබූ රථවාහන වලට අමතරව අමාත්‍යාංශයේ ගාල් කර ඇති රථ 02 ක් හදිසි අනතුරු වලට ලක්වීම නිසා නඩු කටයුතු හා රක්ෂණ ආවරණය කිරීමේ කටයුතු සිදු කරමින් පවතින රථයන් වේ. රථ 04 ක් අලුත්වැඩියා කටයුතු සඳහා ගරාජ් වෙත යොමු කර ඇති අතර මෙම රථයන්හි අලුත්වැඩියාවට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	අලුත්වැඩියා කල යුතු රථවාහන කඩිනමින් අලුත්වැඩියා කර ධාවනයට යොමු කළ යුතුය.
(ඇ)	එකතු වටිනාකම රු.52,200,000 ක් වූ රථ වාහන 12ක අයිතිය පවරාගෙන නොතිබුණ ද වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී නොමැති රථවාහන වල අයිතිය පවරා ගැනීමේ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.	වාහනවල අයිතිය පවරාගත යුතුය.
(ඈ)	සිගාස් වැඩසටහනෙහි රථවාහන පිළිබඳ තොරතුරුවල රථවාහන අංකය සඳහන් නොවූ එකතුව රු.79,848,262 ක් වූ රථවාහන 8ක් පැවතුණි.	මෑත කාලීනව අනුයුක්ත කරන ලද රථවාහන වල අමාත්‍යාංශයට පවරා ගැනීමේ කටයුතු අවසන් වීමෙන් පසු සිගාස් වැඩසටහනේ වත්කම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	අමාත්‍යාංශයේ වත්කම් ලේඛනවල තොරතුරු සමඟ සැසඳිය යුතුය. වෙනස්කම් ඇතොත් නොපමාව නිවැරදි කිරීම් සිදුකළ යුතුය.

4.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 880 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් රජයේ නිලධාරීන්ගේ ඇප අඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් අමාත්‍යාංශයේ නිලධාරීන් එසේ කර නොතිබුණි.	රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගැනීම සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින අතර එම කටයුතු කඩිනමින් අවසන් කිරීමට සැලසුම් කර ඇත.	ඇප තැබිය යුතු නිලධාරීන් වෙතින් ඇප ලබාගැනීමට කටයුතු කළ යුතුය.

4.6 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය තුල මු.රෙ.106 හා මු.රෙ.113 යටතේ වන පාඩු, පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ වර්ෂය තුල අලාභ අයකර ගැනීම්/ කපාහැරීම්/ අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය යටතේ රු.25,000 ට වැඩි සිද්ධි 11 ක් සඳහා රු.28,700,797ක් සටහන් කර තිබූ නමුත් පාඩු හා අත්හැරීම් පිළිබඳව විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු ප්‍රකාරව එම ශේෂය සිද්ධි 13 ක් සඳහා රු.29,267,359 ක් වීම නිසා රු.566,561ක වෙනසක් පැවතුණි. අලාභයේ ස්වභවය අනුව වන වර්ගීකරණයෙහි වාහන සිද්ධි 10 ක් සහ අනෙකුත් සිද්ධි 03 ක් වශයෙන් පිළිවෙළින් රු.28,219,497 ක් හා රු.520,000 ක් දක්වා තිබූ නමුත් එය වාහන සිද්ධි 11 ක් සහ අනෙකුත් සිද්ධි 04 ක් වශයෙන් පිළිවෙළින් රු.28,619,559 ක් හා රු.686,500 ක් වීම නිසා එම ශේෂයන්ගේ	අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමෙන් පසු ලද තොරතුරු වන බැවින් මූල්‍ය ප්‍රකාශනයන්ට ඇතුළත් කිරීමට නොහැකි වී ඇත.	මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තොරතුරු ඇතළත් කිරීමට හා ඒවා තහවුරු කිරීමට අදාල තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

	පිළිවෙළින් රු.400,062 ක් හා රු.166,500 ක වෙනසක් ඇති වී තිබුණි.		
(ආ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය තුල මු.රෙ.106 හා මු.රෙ.113 යටතේ වන පාඩු, පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය යටතේ රු.25,000 ට වැඩි සිද්ධි 02 ක් සඳහා රු.107,574 ක් සටහන් කර තිබූ නමුත් පාඩු හා අත්හැරීම් පිළිබඳව විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව එම ශේෂය සිද්ධි 04 ක් සඳහා රු.377,557 ක් වීම නිසා රු.269,978 ක වෙනසක් පැවතුණි. අලාභයේ ස්වභාවය අනුව වන වර්ගීකරණයෙහි වාහන සිද්ධි 02 ක් සඳහා රු.107,574 ක් සඳහන් කර තිබූ නමුත් විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු ප්‍රකාරව එය වාහන සිද්ධි 03 ක් සහ අනෙකුත් සිද්ධියක් වශයෙන් පිළිවෙළින් රු.211,052 ක් හා රු.166,500 ක් වීම නිසා එම ශේෂයන් අතර රු.269,978 ක වෙනසක් පැවතුණි.	පිළිතුරු ලබාදී නොමැත.	මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තොරතුරු ඇතළත් කිරීමට හා ඒවා තහවුරු කිරීමට අදාල තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

4.7 කළමනාකරණ දූර්වලතා

	විගණන නිරික්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම තුල මියගිය නිලධාරින් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.193,787 ක ශේෂයක්ද විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.101,386 ක ශේෂයක්ද සේවය හැර ගොස් සිටින නිලධාරීන් පස් දෙනෙකුගෙන් අයවිය යුතු රු.364,817 ක ශේෂයක්ද වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් නොවී පැවතුණි.	මෙම ණය ශේෂ විද්‍යා අංශයේ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය වන අතර 2024 නොවැම්බර් 25 දිනැති අති විශේෂ ගැසට් අංක 2412/08 මගින් මෙම අමාත්‍යාංශය යටතේ පැවති විද්‍යා අංශය 2025 ජනවාරි 01 දින සිට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත පැවරීමක් සිදුකර ඇත. ඉදිරි කටයුතු කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත දැනුම් දීමට කටයුතු කර ඇත.	අය නොවූ ණය ශේෂ අයකර ගැනීමට චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	2024 මාර්තු 21 දින ගිනිගැනීමට ලක් වූ මෝටර් රථයක් නැවත අලුත්වැඩියා කිරීමට නියෝජිත ආයතනය විසින් රු.602,809 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු අතර විගණිත දිනය වන 2025 මැයි 14 දින තෙක් මෙම අලාභය සඳහා රක්ෂණ වන්දි ලබාගැනීම හෝ අලුත්වැඩියා කටයුතු හෝ සිදුකර නොතිබුණි.	අදාල රථය 2024 මාර්තු 21 දින හදිසි ගිනි ගැනීම නිසා අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුවක් ලබා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇත. අදාල වාහන වර්ගයේ සමහර අමතර කොටස් වෙළඳපලේ සොයා ගැනීමට ඇති අපහසුතාවය නිසා රක්ෂණ සමාගම වෙත ඉදිරිපත් කිරීම සඳහා එක් එක් අයිතමයේ මිල ගණන් ඇතුලත් කර ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. වාහනයේ අලාභය තක්සේරු කිරීමට නොහැකි වී ඇති බැවින් අලුත්වැඩියා කටයුතු ප්‍රමාද වී ඇත. වාහන අලුත්වැඩියාව සඳහා යොමු කල ආයතනය හා රක්ෂණ සමාගම සමඟ සාකච්ඡා කර මෙම වාහනයේ අලුත්වැඩියාවට අදාල ඉදිරි කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.	රක්ෂණ වන්දි ලබාගැනීම හා වාහන අලුත්වැඩියාව කඩිනමින් සිදුකළ යුතුය.

(ඇ)	අමාත්‍යාංශ ගොඩනැගිල්ලට යාබද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේදී ඉදිකිරීම් ආයතනයේ දෝෂයන් හේතුවෙන් 2024 අප්‍රේල් 09 දින අමාත්‍යාංශයේ කාණු පද්ධතිය අවහිර වී අමාත්‍යාංශයේ ප්‍රතිව්‍යුහගතකරණ අංශය ජලයෙන් යටවී තිබුණු අතර මේ හේතුවෙන් සිදුවූ අලාභය රු.821,286 ක් බවට සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) විසින් තක්සේරු කර තිබුණි. මෙම අලාභය ගෙවීමට මාර්ගය ඉදිකිරීම් ආයතනය එකඟවී තිබුණ ද විගණිත දිනය වූ 2025 අප්‍රේල් 28 වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශය තුල මේ පිළිබඳව අනාවරණය කිරීමද සිදු කර නොතිබුණි.	අමාත්‍යාංශයේ ප්‍රතිව්‍යුහගතකරණ අංශය ජලයෙන් යටවීම හේතුවෙන් සිදු වී ඇති අලාභය තක්සේරු කිරීමට කටයුතු කර ඇති අතර අදාල අලුත්වැඩියා කටයුතු සිදුකර ඇත. මේ සම්බන්ධව මුදල් රෙගුලාසි අනුව කමිටුවක් පත්කර පූර්ණ වාර්තාව සැකසීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමට සැලසුම් කර ඇත.	අලාභය අයකර ගැනීමට අදාල ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඈ)	බුත්තල කර්මාන්තපුරය පිහිටුවා වර්ෂ 18 ක කාලයක් ගතවී තිබුණද කිසිදු කර්මාන්තකරුවෙකු බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණු අතර එක් කර්මාන්තකරුවෙකු පමණක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු.1,068,000 ක බද්දක් ගෙවා තිබුණි.	අංක අමප/ 24/2210/814/011 හා 2024 දෙසැම්බර් 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.	බදු ගිවිසුම් නියමාකාරයෙන් අත්සන් කර බදු මුදල් අයකර ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය.
(ඉ)	රයිගම් කර්මාන්තපුරයේ රු.මිලියන 87.96ක වියදමක් දරා පරිපාලන ගොඩනැගිල්ලක් හා බුත්තල කර්මාන්තපුරයේ රු.මිලියන 3.585 ක වියදමක් දරා නිල නිවාසයක් ඉදිකර තිබුණද ඒවා භාවිතයකින් හා නිසියාකාරව නඩත්තු කිරීමකින් තොරව පැවතීම නිසා එම ගොඩනැගිල්ල වෙනුවෙන් (ඉදි කිරීම) දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.	රයිගම කර්මාන්ත හා තාක්ෂණික අධි කලාපයෙහි වර්ග අඩි 29,000 ක් පමණ වූ පරිපාලන ගොඩනැගිල්ලෙහි ඉඩකඩ, කර්මාන්තපුරයේ නව කර්මාන්ත ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා තෝරා ගනු ලැබ ඇති ආයෝජකයින් කිහිපදෙනෙකු විසින් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති අතර තක්සේරු වටිනාකම ලබාගෙන ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත.	ගොඩනැගිලි නිසිපරිදි නඩත්තු කර භාවිතයට ගත යුතුය.

		බුත්තල කර්මාන්තපුරයේ ඇති සේවක නිවස්නය කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය මත රජයේ තක්සේරු මුදලක් අයකර ලබාදීමට කර්මාන්තපුරයේ ආයෝජක සංගමයේ සාමාජිකයින්ගෙන් විමසා ඇතත් මේ දක්වා සාර්ථක පිළිතුරක් ලැබී නොමැත.	
(ඊ)	බුත්තල කර්මාන්තපුරයෙහි කාඩ්බෝඩ් හා රෝහල් උපකරණ නිෂ්පාදන කටයුතු කර්මාන්තයක් ආරම්භ කිරීම සඳහා අක්කර 01 පර්චස් 05 ක බිම් ප්‍රමාණයක් කර්මාන්තකරුවෙකුට ලබා දී තිබූ නමුත් අදාල ආයෝජකයා විසින් ඉදිරිපත් කර තිබූ ව්‍යාපාර සැකසුමට පටහැනි පොල්ලෙලි ආශ්‍රිත ව්‍යාපාරයක් කරගෙන යන බවත් ඒ සඳහා අදාල අනුමැතීන් නොතිබූ බවත් එම කාර්යය සඳහා වෙන්කර දී තිබූ ඉඩම් ප්‍රමාණය ඌන උපයෝජනය වී තිබුණි.	මෙම ආයෝජකයා විසින් මුලින් කාඩ්බෝඩ් හා රෝහල් උපකරණ නිෂ්පාදන කටයතු සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීම පරිදි මෙම කර්මාන්තශලාව ආරම්භ කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබාදී ඉඩම වෙන් කිරිමේ ලිපියද 2018 පෙබරවාරි 18 දින නිකුත් කර ඇත. නමුත් ආයෝජකයා විසින් පසුව ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මඟින් අමුද්‍රව්‍ය ආනයනය කිරීමේ ගැටළු මත මෙම කර්මාන්තය පොල්ලෙලි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තශාලාවක් ලෙස වෙනස් කරදෙන ඉල්ලා 2020 නොවැම්බර් 20 දින ලිඛිතව ඉල්ලිමක් කර ඇති අතර එයට අදාළ ව්‍යාපෘති වාර්තාවද ඉල්ලුම් පත්‍රයද ඉදිරිපත් කර ඇත. නමුත් මෙම ඉල්ලීම ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුවේ අනුමැතිය ලබාගෙන තිබේද යන්න තහවුරු වී නොමැති බැවින් මීළඟ කමිටු රැස්වීමට ඉදිරිපත් කර අදාළ සංශෝධනය සිදු කිරීමට සහ නිර්දේශය ලබාගෙන අමාත්‍යාංශයේ අනුමැතියට යොමු කිරිමට නියමිතව ඇත. තවද ඌණ උපයෝජිත ඉඩම් කොටස භාවිතා නොකරන්නේ නම් එම ඉඩම් කොටස අවලංගු කර වෙනත් ආයෝජකයෙකුට ලබාදීමට කටයුතු කරන බවටද කර්මාන්තකරු දැනුවත් කිරීමට පියවර ගෙන ඇත.	කර්මාන්තපුරයන් හි සිදු කරනු ලබන කර්මාන්ත පිළිබඳ පසු විපරම් ක්‍රමවේදයක් සැකසිය යුතු අතර අනුමත කරන කර්මාන්ත වලට පටහැනි වෙනත් කර්මාන්ත පවත්වාගෙන යන්නේ නම් ඒවා නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකසා නිසි අනුමැතිය යටතේ සිදු කිරිමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය.

(උ)	දේශීය රතු මැටි උළු නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතික ලබාගැනීමට අවශ්‍ය මූල්‍ය සහය ලබාදීම සඳහා වූ ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට 2016 වර්ෂයේදී රු.4,298,224 ක් ගෙවා තිබුණ ද එහි සත්‍ය වියදම රු.3,032,462 ක් විය. ඒ අනුව, වැඩිපුර ගෙවා තිබූ රු.1,265,762 ක මුදල සුදුසු කර්මාන්තශාලා තෝරාගෙන ප්‍රමිති සහතික ලබාගැනීමේ කාර්යයට යොදාගන්නා බව විගණනයට දන්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය දක්වාම මෙම මුදලින් අපේක්ෂිත කාර්ය ඉටුව නොතිබුණි.	ඉතිරිවී ඇති මුදල අමාත්‍යාංශය වෙත එවීමට කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙත දන්වා ඇත.	වැඩිපුර ගෙවා ඇති මුදල ප්‍රමිති සහතික ලබාගැනීමේ කාර්යයට යෙදවීම හෝ එසේ නොමැති නම් ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඌ)	කර්මාන්තකරුවන් වෙත ඉඩම් වෙන්කිරීමේදී නිකුත් කරනු ලබන ඉඩම් වෙන්කිරීම් ලිපියට අනුව ඉඩම් වෙන්කිරීමෙන් පසුව අවුරුදු 35ක දීර්ඝකාලීනව බදු ගිවිසුමක් අත්සන් කළයුතු වුවද කර්මාන්තපුර 30ක කර්මාන්තකරුවන් 347 ක් සඳහා බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි.	කර්මාන්තපුරවලින් ඉඩම් වෙන් කර දී ඇති, එහෙත් බදු ගිවිසුම තවමත් සකස් වී නොමැති ආයෝජකයින්ගේ බදු ගිවිසුම කඩිනම්ව සකස් කර දීම සඳහා අමාත්‍යාංශය විසින් කර්මාන්තපුර මට්ටමින් ජංගම සේවා පැවැත්වීම 2021 වර්ෂයේ සිට ආරම්භ කර මේ වන විට ක්‍රියාත්මක කෙරේ.	ඉඩම් වෙන් කිරීමේ කටයුතු සිදු වීමත් සමහම බදු ගිවිසුම් අත්සන් කිරීමද සිදු කළ යුතුය.
(එ)	ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප පිහිටුවීම සඳහා වන ව්‍යාපෘතිය යටතේ ගිරාදුරුකෝට්ටේ, දිඹුලාගල, දික්වැල්ල හා ත්‍රිකුණාමලය අදියර III යන කර්මාන්තපුර 4ක ඉඩම් මැනුම් කර ගැනීම, එළිපෙහෙළි කිරීම හා ඉඩම් කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කිරීම වැනි කටයුතු සඳහා රු.3,266,558 ක් 2022 වර්ෂයේ වියදම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ එම ව්‍යාපෘතිවල කටයුතු අත්හිටුවා තිබීම හේතුවෙන් ඒ වෙනුවෙන් දරන ලද වියදම්	මෙම නව කර්මාන්තපුර 04 ම 2022 ජාතික අයවැය යෝජනාව තුළින් ප්‍රකාශයට පත්කල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් කර්මාන්තපුරයක් බැගින් ස්ථාපිත කිරීමේ විශේෂ ජාතික වැඩසටහන යටතේ ආරම්භ කරන ලද ව්‍යාපෘතින් වේ. 2022 අයවැය තුළින් ඒ සඳහා රුපියල් මිලියන 5000 ක් වෙන් වුවද වසර ආරම්භයත් සමඟ රටතුළ ඇති වූ දේශපාලන අස්ථාවරත්වය, රටතුල පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් වෙන්කල මුදල් ප්‍රායෝගිකව නොලැබුණු අතර රජය විසින් සංවර්ධන කාර්යයන් සඳහා මුදල් නිදහස් කිරීම දැඩි සමාලෝචනයකට ලක් කර තිබුණි. ඒ අනුව නිදහස් වූ සීමිත ප්‍රතිපාදන යොදා	කර්මාන්තපුර සඳහා වියදම් දැරීමට පෙර එහි අවශ්‍යතාවය පිළිබඳව සමාලෝචනය කළ යුතුය.

නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි.	ගනිමින් ඒ වන විටත් සංවර්ධන කටයුතුවලින් වැඩි ප්‍රමාණයක් නිම කරනු ලැබ ඇති කර්මාන්තපුරවල කටයුතු පමණක් මුළුමනින් නිම කිරීමට අමාත්‍යාංශය ගත් තීරණයත් සමඟ මෙම කර්මාන්තපුර 04 හි සංවර්ධන කටයුතු තාවකාලිකව නතරකර ඇත. මෙම අංශය වෙත අයවැය මගින් වෙන්වන ප්‍රතිපාදන ප්‍රමාණය අනුව හා ප්‍රමුඛතාවය අනුව ඉදිරියේදී මෙම කර්මාන්තපුර 04 හි සංවර්ධන කටයුතු සිදු කිරීමට නියමිත බව.	

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව එම අංශය විසින් 2024 වර්ෂය සඳහා විගණන විමසුම් 13ක් නිකුත් කිරීමට අපේක්ෂා කර තිබුණද නිකුත් කරන ලද විගණන විමසුම් ගණන 02කට සීමා වී තිබුණි.	2024 වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙනුවෙන් විගණන විමසුම් 02 ක් පමණක් ඉදිරිපත් කලද, කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව ,අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසන් සභාව,පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතන වලට අදාලව අභ්‍යන්තර විගණන සැලසුමෙන් පරිබාහිර විශේෂ විගණන විමර්ශන 11 ක් සිදු කර තිබුණි. එම විශේෂ විමර්ශණ රාජකාරි සඳහා නිලධාරීන් යෙදවීම හේතුවෙන් අපේක්ෂිත පරිදි අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණන විමසුම් ඉදිරිපත් කිරීමට නොහැකි විය.එමෙන්ම ජනාධිපතිවරණය හා මහමැතිවරණය 2024 වර්ෂයේ අගභාගයේදී පැවැත්වීම හේතුවෙන් ඒ සඳහා නිලධාරීන් නිදහස් කිරීමෙන් විගණන සැලසුමේ පරිදි අමාත්‍යාංශය තුළ සිදු කිරීමට අපේක්ෂිත විගණන විමසුම් ප්‍රමාණය සිදු කිරීමට නොහැකි විය.	සැලසුම් කළ පරිදි අභ්‍යන්තර විගණනය සිදුකල නොහැකි නම් තම අංශය යටතේ පවතින ආයතන වල අභ්‍යන්තර පාලන දුර්වලතා අවම කර ගැනීමට කළ යුතු පරීක්ෂණ ක්‍රමාණුකූලව සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.

6. මානව සම්පත් කලමානකාරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය අවසන් වන විට සමස්ථ පුරප්පාඩු 233 ක් පැවති අතර එයින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 21ක් තෘතියික මට්ටමේ පුරප්පාඩු 02ක් ද්විතියික මට්ටමේ පුරප්පාඩු 184 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 26ක් පැවතුණි.	රාජ්‍ය සේවයේ නව බඳවා ගැනීම් සීමාවීම නිසා 2025 ජනවාරි මස තථ්‍ය කාර්ය මණ්ඩලයේ ප්‍රමාණයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ ප්‍රමාණය අනුමත කර ඇත. දැනට පවතින පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත.	අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු ඉක්මනින් සම්පූර්ණ කර ගත යුතුය.